# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)

# ඇබෑර්තු

NERDC යනු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන සංවිධානය වේ. NERDC ජාතික වැදගත්කම සහ ප්‍රමුඛතා මත පදනම් වූ බුද්ධිමය වශයෙන් අභියෝගාත්මක ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ගණනාවක නිරත වන අතර දිවයින පුරා කර්මාන්ත සඳහා විවිධ තාක්ෂණික සේවාවන් සිදු කරයි.

පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් උද්යෝගිමත්, ක්‍රියාශීලී සහ නවෝත්පාදක ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ ජනරාල් - HM 2-3

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් : (පහත 01 හෝ 02)**

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ ඉහළ ශ්‍රේණියක් සහිත වසර 4 ක ඉංජිනේරු පළමු උපාධියක් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (වරලත්) හෝ මාස්ටර් මට්ටමේ පශ්චාත් උපාධියක්

හෝ

02. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, වසර 4 ක ඉංජිනේරු පළමු උපාධියක් සහ මාස්ටර් මට්ටමේ පශ්චාත් උපාධියක් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (වරලත්)

**පළපුරුද්ද** : ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 10 ක සහ වරලත් සාමාජිකත්වය ලැබීමෙන් පසු වසර 5 ක පළපුරුද්ද ඇතුළත්ව පළමු උපාධිය ලැබීමෙන් අනතුරුව පිළිගත් සංවිධානයක වසර 20 ක පළපුරුද්ද.

**වයස් සීමාව** : වයස අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

(රාජ්‍ය සංස්ථා / මණ්ඩල / වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

හෝ

NERDC නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ලෙස වසර පහක (05) සේවා පළපුරුද්ද

**වැටුප් පරිමාණය** : HM 2-3 - 2025 : රු. 173,000 - 12 x 4,850 - 231,200/-

(වෘත්තීය දීමනාව, සන්නිවේදන දීමනාව, ජීවන වියදම් දීමනාව ආදිය ඇතුළත්ව රජයේ අනුමත සියලු දීමනා + 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- NERDC විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 15% ක දායකත්වයක් දරනු ලබන අතර සේවකයා විසින් 10% දායකත්වයක් දැරිය යුතුය.
- NERDC විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා වැටුපෙන් 3% ක දායකත්වයක් දරනු ලැබේ.
- රජයේ අනුමත ප්‍රවාහන දීමනාව රු. 50,000/- හෝ NERDC විසින් නඩත්තු කරනු ලබන වාහනය, අදාළ රාජ්‍ය චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දීමනාව.
- NERDC හි අනුමත වෛද්‍ය යෝජනා ක්‍රමය ප්‍රකාරව වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය.
- අදාළ රාජ්‍ය චක්‍රලේඛයන්ට අනුකූලව වෙනත් රජයේ අනුමත දීමනා / වරප්‍රසාද.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :** 2025.10.12

සම්පූර්ණ ජීව දත්ත, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකථන අංක සහ අධ්‍යාපනික, වෘත්තීය සහ පළපුරුද්ද සඳහා අදාළ සහතික පිටපත් සහිත අයදුම්පත්, අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියා පදිංචි තැපැල් මඟින් එවිය යුතුය.

(අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ, රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත මණ්ඩල ආදියෙහි අයදුම්කරුවන්ගේ අයදුම්පත්, එවැනි අයදුම්පත් සලකා බැලීම සඳහා අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය)

**ලේකම්,**
**විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය,**
**3 වන මහල,**
**සෙත්සිරිපාය අදියර 1, බත්තරමුල්ල.**

**දුරකථන** : **011-2879410, 011-2879404**
**වෙබ් අඩවිය** : **www.most.gov.lk**